# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 496/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 21/03/2024 පැය 1235

## මාධ්‍ය නිවේදනය

**01. විදේශ රටක නිෂ්පාදිත පිස්තොල අවියක් හා හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසය.**

2024.03.19 වන දින සිට පොලිස්පතිතුමාගේ උපදෙස් පරිදි ක්‍රියාත්මක කරන ලද සංවිධානාත්මක අපරාධ මැඩලීමේ විශේෂ මෙහෙයුමට සමගාමීව බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් 2024.03.20 වන දින සවස් කාලයේ මීරිගම පොලිස් වසමේ ඇලපිල්ලෑව ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර විදේශ රටක නිෂ්පාදිත පිස්තෝල ගිනි අවියක්, සජීව පතරොම් 06ක්, පතරොම් ගැබක් හා හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලි ග්‍රෑම් 200 සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 47 ක් වන මීරිගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු සම්බන්ධයෙන් බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසය.**

2024.03.19 වන දින සිට පොලිස්පතිතුමාගේ උපදෙස් පරිදි ක්‍රියාත්මක කරන ලද සංවිධානාත්මක අපරාධ මැඩලීමේ විශේෂ මෙහෙයුමට සමගාමීව බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් 2024.03.21 වන දින අළුයම් කාලයේ වැල්ලම්පිටිය පොලිස් වසමේ කොලොන්නාව ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලි ග්‍රෑම් 500 සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 35 ක් වන කොලොන්නාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු සම්බන්ධයෙන් බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.

2024.03.20 වන දින සවස් කාලයේ කොළඹ අපරාධ කොට්ඨාසයේ සංවිධානාත්මක විමර්ශන ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ ගැමුණු මාවත ප්‍රදේශයෙදි වැටලීමක් සිදුකර හෙරොයින් ග්‍රෑම් 03 මිලි ග්‍රෑම් 260 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 43 ක් වන ග්‍රෑන්ඩ්පාස් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු සම්බන්ධයෙන් කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 04. රිය අනතුරක් - වැල්ලවාය පොලිස් වසම

2024.03.21 වන අද දින උදෑසන කාලයේ වැල්ලවාය පොලිස් වසමේ වැල්ලවාය - තණමල්විල මාර්ගයේ දී උල්කන්ද දෙස සිට වැල්ලවාය දෙසට ධාවනය වූ පුද්ගලික බස් රථයක් ඉදිරියෙන් එම දෙසටම ධාවනය වූ කාර් රථයක පිටුපස ගැටී අනතුරුව බස් රථය මාර්ගයේ පෙරළී අනතුරක් සිදු වී ඇත.

මෙම අනතුරින් බස් රථයේ ගමන් ගත් **පාසල් ළමුන් 05 දෙනෙකු, මඟින් 05 දෙනෙකු හා බස් රථයේ රියදුරු තුවාල ලබා ප්‍රතිකාර සඳහා වැල්ලවාය රෝහලට ඇතුලත් කර ඇත.** වැල්ලවාය පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**